**දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරීත්ව ව්‍යාපෘතිය - 2020**

------------------------------------------------------------------------------------------------

දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරීත්ව ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව අතර 2019 අප්‍රේල් 11 දින එළඹි අංක ටීඑෆ්0බී0017 ප්‍රදාන ගිවිසුමේ II (අ) (අ) වන කොටසේ II වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුම අනුව, පරිසර අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික දේශගුණික වෙනස්වීමේ ප්‍රතිපත්ති, උපායමාර්ග සහ ක්‍රියාමාර්ග සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමට ප්‍රදානලාභියාගේ ධාරිතාව සහ පද්ධති ශක්තිමත් කිරීම හෝ වෙළඳ හා වෙළඳපොළ නොවන අවමකිරීමේ උපකරණ ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 315 කට සමාන ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 1.8 ක් වන අතර මුළු මුදලම මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 අප්‍රේල් 11 දින ආරම්භ කරන ලද අතර 2021 පෙබරවාරි 28 දින වනවිට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි.

**1.3** මතය

-------

මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවල බලපෑම හැරුණු කොට, 2020 දෙසැම්බර් 31 දිනට දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරීත්ව ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4** මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණ | මුදල රු. | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ව්‍යාපාතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද සියළු වියදම් දැක්විය යුතු වුවත්, එසේ කර නොතිබුණි. | 38,110,000 | මේ සම්බන්ධයෙන් වැඩිදුර අධ්‍යයන හා ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ව්‍යාපෘති සම්බන්ධ සියළු වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කල යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

| අංකය | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුගත නොවීම්/ විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| i. | 2018 ඔක්තෝම්බර් දිනැති 63/2018 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සහ 2018 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය | අමාත්‍යාංශයේ පූර්ණකාලීන නිළධාරීන් ඇතුළත් කරමින් ව්‍යාපෘති ඒකකයට කාර්ය මණ්ඩලය යෙදවිය යුතුය. නමුත් අමාත්‍යාංශයට පරිබාහිරින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයේ පූර්ණකාලීන නිළධාරීන් ඇතුළත් කරමින් ව්‍යාපෘති ඒකකයේ කාර්ය මණ්ඩලය සමන්විත වියයුතු බව සඳහන් වුවත්, ව්‍යාපෘතියේ විෂයයේ ගැඹුරු තාක්ෂණික සහ විශේෂඥතාවයේ අවශ්‍යතාවය මත ලෝක බැංකුවේ අවශ්‍යතාවය පරිදි බාහිරින් බඳවාගත් නිලධාරීන්ගෙන් සමන්විත ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවන ලදී. | අමාත්‍ය මණ්ඩල තීරණ අනුව කටයුතු කළ යුතුය. |
| ii. | 2019 මාර්තු 15 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 01/2019 චක්‍රලේඛයේ 09 පරිච්ඡේදය සහ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ් සහ පීඩී/ඊආර්ඩී/2020/01 චක්‍රලේඛයේ 05 පරිච්ඡේදය සහ විදේශ ප්‍රදාන ගිවිසුමේ 2 උපලේඛනය සහ 02 පරිච්ඡේදය | 2019 මැයි 03 දින මෙම ව්‍යාපෘතිය සඳහා කමිටු පත් කිරීම සිදුවූ අතර 2020 මැයි 05 දින පමණක් කමිටු රැස්වීම් පවත්වා තිබුණි. | සඳහන් කළ කාලය තුළ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව පත් කළද, අදාළ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ නියෝජනය මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා අත්‍යාවශ්‍ය බැවින් ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස සුදුසු නිළධාරියෙකු පත් කරන තුරු අදාළ රැස්වීම් වාර පැවැත්වීම කල් දමා තිබුණි | චක්‍රලේඛවල අවශ්‍යතාවය පරිදි රැස්වීම් පැවැත්විය යුතු අතර කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය. |
| iii. | මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 2020 | ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා විසින් අයවැය ඇස්තමේන්තු | අදාළ වර්ෂය සඳහා සංශෝධිත ඇස්තමේන්තුගත මූළ | ව්‍යාපාතියේ අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීම සඳහා කටයුතු |

| | | | |
|---|---|---|---|
| පෙබරවාරි 12 දිනැති අංක එම්ඕඑෆ්ර් සහ පීඩී/ඊආර්ඩී/2020 චක්‍රලේඛය | ප්‍රතිපාදන අදාළ අරමුණ සඳහා උපයෝජනය කල බවට සහතික කළ යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාතිය විසින් උපයෝජනය කල මුදල රුපියල් 39,225,901 කි. ඒ අනුව, වර්ෂය අවසානයේ ව්‍යාපාතියේ මූල්‍ය කාර්යසාධනය සියයට 39.41ක් පමණක් විය. | වෙන්කිරීම රුපියල් 99,531,000 වුවද, වර්ෂය අවසානයේදී ව්‍යාපාතියේ ප්‍රධාන සංරචක 03ක් ඉවත් කිරීමට සිදුවිය. එබැවින්, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාතිය විසින් උපයෝජනය කල මුදල ආසන්න වශයෙන් රුපියල් 39,225,901 කි. | කළ යුතුය. |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපාතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය<br>ප්‍රතිශතය | ළඟාකරගෙන ඇති කාර්යසාධනය<br>ප්‍රතිශතය | | | |
| 2.2 | අධීක්ෂණය, වාර්තාකරණය සහ සත්‍යාපනය ක්‍රමවේදය සහ ශ්‍රී ලංකා කාබන් ලේඛනය සම්බන්ධයෙන් අංශික පුහුණුවීම් ලබා දීම | 100 | 20 | මන්දගාමී ප්‍රගතියක් නිරීක්ෂණය විය | උපදේශන සේවා ලබාදීම සඳහා ප්‍රතීතන ආයතනයක් තෝරාගැනීමේ අදියර දක්වා අවශ්‍ය සියළු ප්‍රසම්පාදන වැඩ අවසන් කර ඇත. කෙසේවුවද, එය ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන සේවා ඇරඹිය යුතුය. කෙසේවුවත් විවිධ හේතු නිසාවෙන් මෙම උපදේශන සේවා සම්පූර්ණ කිරීමට නොහැකි විය. එම නිසා අපේක්ෂිත ප්‍රගතිය අත් කර ගත නොහැකි විය. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2.2 | අධීක්ෂණය, වාර්තාකරණය සහ සත්‍යෝක්ෂණ ක්‍රමවේදය සහ ශ්‍රී ලංකා කාබන් ලේඛනය ක්‍රියාවේ යෙදවීම, මෙහෙයවීම හා පවත්වාගෙන යාම | 100 | 10 | මන්දගාමී ප්‍රගතියක් නිරීක්ෂණය වීම | ප්‍රතීතන ආයතනයක් තෝරාගැනීමේ අදියර දක්වා අවශ්‍ය සියළු ප්‍රසම්පාදන වැඩ අවසන් කර ඇති අතර උපදේශන සේවා සඳහා අභිප්‍රාය නැවත ප්‍රකාශ කිරීම කැඳවන ලෙස ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර ඇත. කෙසේවුවද, පවත්නා සීමිත කාලය තුළ එය ඉටු කිරීම ප්‍රායෝගික නොවන බැවින් මෙම උපදේශන සේවා ක්‍රියාත්මක නොකරන ලෙස ලෝක බැංකුව උපදෙස් දෙන ලදී. මීට ආදේශකයක් ලෙස, වර්තමානයේ වෙළඳපොළ සූදානම්වීම සඳහා හවුල්කාරීත්වයක් ක්‍රියාකාරීත්වයේ පවතින රටවල් සඳහා ගොඩනගා ඇති, අධීක්ෂණය, වාර්තාකරණය සහ සත්‍යෝක්ෂණ ක්‍රමවේදය සහ ලේඛන පද්ධති 02ක් ශ්‍රී ලංකාවේ ඇති කිරීමට ලෝක බැංකුව යෝජනා කර ඇති අතර ලෝක බැංකුව තීරණය කළ පරිදි ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සඳහා සකස් විය යුතුවේ. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| _ | ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය | 100 | 12.45 | සමුච්චිත මූල්‍ය ප්‍රගතිය අඩු මට්ටමක ඇත | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කළ කාලයෙන් බොහොමයක් ක්‍රියාකාරකම් ඉටු කිරීමට තිබුණු වර්ෂය 2020 වර්ෂයයි. ඒ අනුව, අදාළ ක්‍රියාකාරී | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

සැලැස්ම පිළියෙල කෙරුණි. නමුත් රටේ පැවති කොවිඩ්-19 වසංගතය එම ඉලක්ක ළඟා කර ගැනීමට වැඩි බලපෑමක් ඇති කෙරුණි. මේ නිසා, උපදේශන සේවා ලබා ගැනීමට අදාළ අවශ්‍ය සියළු ක්‍රියාකාරකම් සැළසුම් කළ කාලය තුළ සිදු කරගත නොහැකි විණි.

### 3.2 නිෂ්ක්‍රීය/ උපයෝජනය නොකළ/ ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 29 දින මිලදී ගත් පරිගණක 55න් 38ක් සැළසුම් කළ ආයතනවලට බෙදාහැර ඇති අතර 2021 අගෝස්තු 05 වන දින වන විටත්, ඉතිරි පරිගණක 17 ව්‍යාපෘතියේ රඳවා ගෙන තිබුණි. කෙසේවෙතත්, තාක්ෂණික සහය නොමැතිව සියළුම පරිගණක උපයෝජනය කල නොහැකි අතර විගණිත දින වන විටත් ඒවා නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම පරිගණක බෙදාහැරීම ප්‍රමඛගත කිරීමට සැළසුම් කර තිබූ අතර දත්ත ලබාදීමේ ආයතන 55 විසින් සැපයූ දත්ත මත පදනම්ව බෙදාහැරීම් කර ඇත. කෙසේවෙතත්, පෙබරවාරි අග වන විට ජාතික දේශගුණික වෙනස්වීමේ දත්ත හුවමාරු ජාලය සම්පූර්ණ කිරීමට තිබූ අතර ගිවිසුම්ගත වීමට සහ මෙ පද්ධති පිළිබඳ අදාළ පාර්ශවකරුවන් පුහුණු කිරීමට විශාල කාලයක් ගත වී ඇත. ඒ අනුව, හඳුනාගත් ආයතන 38ට 2021 අප්‍රේල් 22 වන විට බෙදාහැරීම සඳහා සහ ඉතිරි පරිගණක 17 වෙන්කළ ආයතන බෙදාහැරීමට අවශ්‍ය සම්බන්ධීකරණය කර ඇත. එබැවින්, ගිවිසුම නිගමනය කළ පසුව හැකි ඉක්මනින් ඒවා බෙදාහරින බව තවදුරටත් මා දන්වමි. | සම්පත් ඒවාහි අරමුණ සඳහා යෙදවීමට ඉක්මන් සහ කාර්යක්ෂම පියවර ගැනීම |

**3.3. පද්ධති හා පාලනයන්**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| i. | මුදල් පොත ක්‍රමානුකූලව සහ විධිමත්ව නඩත්තු කර නොතිබුණි. | පවතින අඩුපාඩු නිවැරදි කරන අතර ක්‍රමානුකූලව මුදල් ලේඛනය පවත්වා ගනු ලැබේ. | ඒ අනුව මුදල් පොත නඩත්තු කළ යුතුය. |
| ii. | තොග පොත විධිමත්ව නඩත්තු කර නොතිබුණි. | තොග පොතේ අදාළ උපාංග වෙනම ලේඛනගත කිරීමට කටයුතු කරන ලදී. | තොග පොත විධිමත්ව නඩත්තු කළ යුතුය. |
| iii. | ව්‍යාපෘතියට අදාළ බැංකුව විසින් සෘජුවම මූල්‍යයනය කළ ඇමෙරිකානු ඩොලර් මිලියන 1.2 හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි. | ව්‍යාපාතියේ මුළු මූල්‍යයනය ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක් වුවද, ඇමෙරිකානු ඩොලර් මිලියන 1.2ක් ලෝක බැංකුව යටතේද ඇමෙරිකානු ඩොලර් මිලියන 1.8ක් ශ්‍රී ලංකා රජය යටතේද බෙදී ඇත. ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවසන් කළ යුතු භෞතික සංරචක ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික අධ්‍යයනයන් ලෝක බැංකු සංරචක යටතේ සම්පූර්ණ කර තිබූ හෙයින් ලෝක බැංකුව විසින් නිරතුරුවම භෞතික ප්‍රගතිය යාවත්කාලීන කරන අතර ගිණුම් කටයුතු පවත්වා ගෙන යයි. | ව්‍යාපෘතියේ ලෝක බැංකු කොටස පිළිබඳ හෙළිදරව් කළ යුතුය. |
| iv. | 2020 වර්ෂය සඳහා වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. | 2020 අවසානය ව්‍යාපෘතිය අවසන් කරන කාලසීමාව වූ නිසා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ අතර ව්‍යාපෘතිය අවසන් කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොතිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය අවසානයට ළඟාවීම නිසා අමාත්‍යාංශය වෙත වත්කම් භාරදීම සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කරයි. | වත්කම් සත්‍යාපනය කළ යුතුය. |